# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2473/23 - 2026 ජනවාරි මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2026.01.29**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**එල්. ඩී. බී. 1/2026**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

ශ්‍රේෂ්ඨාධිකරණ රීති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ අග්‍රවිනිශ්චයකාරවරයා සහ ඔහු විසින් ඒ ව්‍යවස්ථාව යටතේ නම් කරනු ලැබූ ශ්‍රේෂ්ඨාධිකරණයේ සෙසු විනිශ්චයකාරවරයන් විසින් සාදනු ලැබූ රීති.

**පී. පද්මන් සූරසේන,**
අග්‍රවිනිශ්චයකාර.

**අචල වෙන්ගප්පුලි,**
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර.

**මහින්ද සමයවර්ධන,**
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර.

**අර්ජුන ඔබේසේකර**
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර.

කොළඹ දී ය.

**රීති**

1. මෙම රීති 2026 ශ්‍රේෂ්ඨාධිකරණයේ (ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම සහ ඉලෙක්ට්‍රොනික අධිකරණ සේවා) රීති ලෙස හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු “ඉ - ගොනු කිරීමේ පද්ධතිය” යනුවෙන් සඳහන් කරනු ලබන) ඉලෙක්ට්‍රොනික ගොනු කිරීමේ පද්ධතිය, (මෙහි මින්මතු “ඉ - අධිකරණ වාර්තා” යනුවෙන් සඳහන් කරනු ලබන) ඉලෙක්ට්‍රොනික අධිකරණ වාර්තා සහ කලින් කලට ලබාගැනීමට ඉඩ සලසා ඇති අනෙකුත් ඉ - අධිකරණ සේවා හෝ පහසුකම් සඳහා ප්‍රවේශය ලබා ගැනීමට ඇතුළුව (මෙහි මින්මතු “ඉ - අධිකරණ සේවා” යනුවෙන් සඳහන් කරනු ලබන) ඉලෙක්ට්‍රොනික අධිකරණ සේවා ලබා ගැනීමට


1A - G 46199 — 04 (2026/01)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අපේක්ෂා කරනු ලබන සෑම ලියාපදිංචි නීතිඥවරයකු ම, ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් අග්‍රවිනිශ්චයකාරවරයාගේ අනුමතය ඇතිව කලින් කලට ඉ - අධිකරණ සේවාව හරහා නිශ්චිතව දක්වනු ලබන වාර්ෂික දායක ගාස්තුවක් ගෙවිය යුතු ය.

3. දායක ගාස්තුව ගෙවීමෙන් පසුව, සෑම ලියාපදිංචි නීතිඥවරයකුට ම -

(අ) ඉ - ගොනු කිරීමේ පද්ධතිය;

(ආ) ඉ - අධිකරණ වාර්තා; සහ

(ඇ) කලින් කලට ලබා ගැනීමට ඉඩ සලසා ඇති අනෙකුත් ඉ - අධිකරණ සේවා හෝ පහසුකම්, සඳහා ප්‍රවේශ වීමට අවකාශ සලසා දෙමින් අනන්‍ය වූ ප්‍රවේශ තොරතුරු නිකුත් කරනු ලැබිය යුතු ය.

4. වාර්ෂික දායක ගාස්තු ගෙවීම පැහැර හැරීම, එම ගාස්තුව නිසි පරිදි ගෙවනු ලබන තෙක් 3 වන රීතියේ සඳහන් සේවා සඳහා ප්‍රවේශය ලබා දීම අත්හිටුවීමට හේතු වන්නේ ය.

5. 3 වන රීතිය යටතේ නිකුත් කරනු ලබන ප්‍රවේශ තොරතුරු නීතිඥවරයාට අතිශය පෞද්ගලික විය යුතු අතර ඒවා හුවමාරු කර ගැනීම, හෙළිදරව් කිරීම හෝ පවරා දීම කරනු නොලැබිය යුතු ය.

6. අග්‍රවිනිශ්චයකාරවරයාගේ අනුමතය ඇතිව ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් මෙම රීති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ විධාන, මාර්ගෝපදේශ හෝ ආකෘතිපත්‍ර නිකුත් කරනු ලැබිය හැකි ය.

7. සෑම නීතිඥවරයකුම 6 වන රීතිය යටතේ නිකුත් කරනු ලබන විධාන සහ මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

8. යම් අධිකරණයක ගොනු කිරීමට අවශ්‍ය සෑම උත්තරවාදයක්, ඉල්ලීමක්, අභියාචනයක්, මෝසමක්, ලැයිස්තුවක්, දිවුරුම් ප්‍රකාශයක් හෝ වෙනත් ලේඛනයක් ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් අග්‍රවිනිශ්චයකාරවරයාගේ අනුමතය ඇතිව ඉ - අධිකරණ සේවාව හරහා කලින් කලට නිශ්චිතව සඳහන් කරනු ලබන යම් ගාස්තුවක් ගෙවීමට යටත්ව ඉලෙක්ට්‍රොනිකව ගොනු කරනු ලැබිය හැකි ය.

9. මෙම රීති යටතේ ගෙවිය යුතු සියලුම ගාස්තු ඉ - අධිකරණ සේවාව මගින් ලබාදෙනු ලබන මාර්ගගත ගෙවීම් ද්වාරය හරහා ගෙවිය යුතු ය.

10. මේ රීතිවල, "ලියාපදිංචි නීතිඥවරයකු" යන්නෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ මාර්ගගත දත්ත සමුදායෙහි ලියාපදිංචි වී ඇති නීතිඥවරයකු අදහස් වේ.

EOG 01 - 0285

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.